**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2020**

**-----------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.33,918,887 ක් වූ වත්කම් වර්ග 03 ක වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ ඇස්තමේන්තු කර නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් වී ඇති අතර ඵලදායී ජීවිත කාලයද අවසන් වී ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව සේවක ප්‍රතිලාභ ආයු ගණක තක්සේරු ක්‍රමය (Actuarial valuation Method) අනුව ගණනය කර පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කළ යුතු වුවද, ආයතනය විසින් රු.47,970,000 ක පාරිතෝෂික වෙන් කිරීම් ප්‍රමිතියේ සඳහන් නියමයන්ට අනුව සිදු කර නොතිබුණි. | ශ්‍රී. ල. රා. ගි. අංක 19 අනුව ආයු ගණන තක්සේරු ක්‍රමය අනුව සේවක ප්‍රතිලාභ ගණනය කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. ඉදිරි වර්ෂයේදී අවශ්‍ය ගැලපීම් සිදු කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යස්ථානය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයක් වන ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් සහ වෙනත් දේශීය හා විදේශීය ආයතන වලින් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | භාණ්ඩාගාර ප්‍රදාන සහ වෙනත් ආයතනවල ප්‍රදාන ලැබීම් හා වියදම් කිරීම නිසි පරිදි ගිණුම්ගත කිරීම හා හෙළිදරව් කිරීම කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| (i) මු.රෙ.104 (I) | 2018 වර්ෂයේ සිට 2020 අගෝස්තු දක්වා වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ සිදුකර නොතිබුණි. | රාජකාරී කටයුතුවල නිරතව සිටියදී සිදු වී ඇති මෙම අනතුරු සියල්ල සුළු අනතුරු වන අතර, 2018 වර්ෂයේ සිට 2020 අගෝස්තු දක්වා සිදු වී ඇති අනතුරු 23 කින් අනතුරු 11 ක් සම්බන්ධයෙන් මූලික විමර්ශන කටයුතු සිදු කර නොමැත. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) මු.රෙ.104 (3). | අලාභ සම්බන්ධව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 ට වැඩි ප්‍රමාදයක් සිදුවේනම් ප්‍රාරම්භක වාර්තාවක් එවිය යුතු වුවද වාහන අනතුරු 15 ක් සම්බන්ධයෙන් එසේ ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අළුත්වැඩියාවන් හේතුවෙන් කිසිදු මුදලක් ආයතනය වෙතින් ගෙවීමට සිදු වී නොමැත. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මු.රෙ.104 (4) | 2015 සිට 2017 වර්ෂයට අදාල වාහන අනතුරු 33 ක් සම්බන්ධයෙන්ද 2018 සිට 2020 අගෝස්තු දක්වා වාහන අනතුරු 31 ක් සම්බන්ධයෙන්ද පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ඉහත අංක (i ) (ආ) සහ (ii) යටතේ පිළිතුරු අදාළ වේ. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (iv) මු. රෙ. 105 | 2019 වර්ෂයේ සිට වාර්ෂික තොග සමීක්ෂණයේදී හඳුනාගත් යල්පැන ගිය හා විනාශ කළ යුතු භාණ්ඩ, අයිතම 409 ක ඌණතාවයක් හා අස්ථානගත වූ භාණ්ඩ නිර්දේශිත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර නොතිබුණි. | 2019 සහ 2020 මුදල් වර්ෂ දෙක අවසානයට අපහරණය කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අපහරණ කමිටු පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. |
| (v) මු.රෙ.110 | හානි හා පාඩු ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | හානි හා පාඩු ලේඛනය ලැබී ඇති තොරතුරු අනුව යාවත්කාලීන කර ඇත. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ)2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මධ්‍යස්ථානය විසින් 2014 සිට 2017 දක්වා වාර්ෂික වාර්තා 2021 මාර්තු 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2014 – 2019 වර්ෂයන් වල අවශ්‍ය වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීමට දළ වශයෙන් රුපියල් මිලියන 4 ක් පමණ වැය වන බව ඇස්තමේන්තු කර ඇත. එම මුදල 2021 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රතිපාදන වලින් වෙන් කර ගැනීමට නොහැකි බැවින් මහා භාණ්ඩාගාරය මගින් ලබා ගැනීමට කටයුතු සලසන මෙන් අධ්‍යක්ෂ ජනරාල් විසින් ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම් වෙත ලිඛිතව දැනුම් දී ඇති බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 66.72 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.මිලියන 65.03 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 1.69 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රදාන සහ අනෙකුත් ආදායම් පහල යාම හේතුවක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ කටයුතු නොකර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.මිලියන 1,034.39 ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2010 වර්ෂයේදී ඉදිකර තිබුණි. | ආපදා කළමනාකරණ අංශය විසින් රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය නමින් ගොඩනැගිල්ල පිහිටි මෙම ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | මෙම ගොඩනැගිල්ල හා එම ඉඩම නීත්‍යානුකූලව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කළ යුතු වේ. |
| (ආ) | ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් පිළියෙල කර අවසන් කර නොතිබුණු අතර මානව සම්පත් ප්‍රතිපත්ති සකස් කිරිමේ කටයුතු 2021 මාර්තු 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ප්‍රතිපත්තියේ කෙටුම්පත 2020 සැප්තැම්බර් 03 සකස් කර අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත ඉදිරිපත් කර ඇති බවත් ඒ සඳහා අංශ 04 කින් යෝජනා ඉදිරිපත් කර ඇති බවත් කෙටුම්පත් සංශෝධන කරමින් පවතින අතර රට තුළ පවතින කොවිඞ් -19 වෛරස තත්ත්වය මත අවසන් කළ යුතු දිනට සිදු කිරීමට නොහැකි විය. | ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීමේ කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත සංශෝධන කිරීමට 2008 වර්ෂයේ සිට සිදු කර තිබුණු නමුත් 2020 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2005 අංක දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත සංශෝධන කිරීම ආපදා කළමනාකරණ අංශය විසින් කරන ලද කාර්යයක් බව කාරුණිකව දන්වා සිටිමි. | පනතෙහි සංශෝධන සිදු කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාව වටා පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77 පුනරුත්තාපනය හා නඩත්තු කටයුතු සඳහා පුද්ගලික ආයතනයක් සමග රු.134,746,418 ක ගිවිසුමකට එළඹ තිබුණි. එම කටයුතු සත්‍ය වශයෙන්ම සිදු කරන ලද්දේද යන්න තහවුරු කර ගැනීමකින් තොරව රු.89,764,707 ක් ගෙවීම් කර තිබුණි. මෙම කාර්යෙන් බලාපොරොත්තු වූ කුළුණු 77 ක්‍රියාකාරි තත්වයෙන් පවත්වාගෙන යාම සාර්ථක වී නොතිබුණි. | එම කුළුණු වල පුනරුත්තාපන කටයුතු නියමිත කාලයට අවසන් නොවීමට අදාළ හේතුන් පිලිබඳ සියලු පාර්ශවයන් දැනුවත් කර එයට අදාළවූ හේතුන් සැලකිල්ලට ගෙන ඒම කාලය දීර්ඝ කිරීම අන්තර් කලීන කළමනාකරණ කමිටුවේ හා අමාත්‍යාංශ ලේකම් තුමාගේ අනුමැතියට අනුව සිදු කරන ලදි. | අදාල කාර්යයන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අදාල කාර්යය නිසිලෙස ක්‍රියාත්මක කර තිබුණේද යන්න සහතික වීම මත පමණක් මුදල් ගෙවීම කළ යුතු වේ. |
| (ආ) | 2020 පෙබරවාරි 13 දිනැති ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ උපදෙස් මාලාවේ (1) ජේදය පරිදි රාජ්‍ය ආයතනවලට අවදානම අවම කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය සම්පත් නොමැති බවට එම ආයතන විසින් සහතික කර ඉල්ලීමක් කළ යුතු වුවත්, එවැනි ඉල්ලීම් කිරීමකින් තොරව රු. 29,958,885 ක් ව්‍යාපෘති 26 ක් සඳහා විවිධ රාජ්‍ය ආයතනවලට ලබාදී තිබුණි. | දිස්ත්‍රික් ලේකම්වරුන් මෙම ව්‍යාපෘතිය නිර්දේශ කොට ඉදිරිපත් කොට ඇති අතර මෙම ව්‍යාපෘති සඳහා එම ආයතන පිරිවැයක් යොදවා නොමැත. | ව්‍යාපෘති සම්බන්ධ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වටිනාකම රු.13,782,677 වූ ව්‍යාපෘති 11 ක වැඩ අවසන් සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබු අතර, රු.2,350,000 ක ප්‍රතිපාදන මුදාහල ව්‍යාපෘතින් 03 ක ගිවිසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති අවසන්වීමේ ලියකියවිලි මේ වන විට ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව නියමිත ප්‍රමිතියට නිම කළ කළ බවට හා ගිවිසුම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආපදා කළමනාකරණය සඳහා බහුවිධ අවදානම් පැතිකඩ සැකසීම සඳහා 2016 සිට 2019 දක්වා භාණ්ඩාගාරයෙන් රු.මි.247 ක් වෙන්කර දී තිබුණි. ඉන් රු.මිලියන 201 ලැබී තිබුණු අතර රු.මිලියන 53 ක් අදාල අරමුණින් බැහැරව වැයකර තිබුණි. | අමාත්‍යාංශ ලේකම් තුමන් විසින් ගන්නා ලද තීරණ අනුව නිත්‍යානුකූල ලෙස මහාභාණ්ඩාගාරය වෙත දන්වා ප්‍රතිපාදන හුවමාරු කිරීමට කටයුතුකර ඇති අතර ප්‍රතිපාදන පරිභාහිර කාර්යයන් වෙනුවෙන් යෙදවීම සම්බන්ධව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පිළිතුරු ලබාදිය නොහැක. | අරමුදල් අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 කාර්යය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මධ්‍යස්ථානයේ අනුමත කාර්යය මණ්ඩලය 465 ක් වුව ද සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 304 ක් වූ බැවින් පුරප්පාඩු 161 ක් විය. මෙම පුරප්පාඩු පිරවීමට හෝ මානව සම්පත් සැලැස්ම සංශෝධනය කිරීමට හෝ මධ්‍යස්ථානය කටයුතු කර නොතිබුණි. | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩල තනතුරු 465 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර 2020 දෙසැම්බර් 31 වන දින වන විට එම කාර්ය මණ්ඩලයේ 304 දෙනෙකු සේවයේ නියුතුව සිටි අතර තනතුරු 161 ක් පුරප්පාඩුව පැවැතුණි. | කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා මානව සම්පත් සැලැස්ම සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |